# එළවළු හා පළතුරු අපනයනය පිළිබඳ නව සංකල්පයක්

කෘෂිකාර්මික සම්පත් බහුලව පවතින ශ්‍රී ලංකාව මීට සියවසකටත් ප්‍රථම තේ, රබර්, පොල් හා කුළුබඩු වර්ග අපනයනය තුලින් ලෝකයේ බොහෝ රටවල් අතර ප්‍රසිද්ධියට පත්වී තිබිණ.

කෘෂිකාර්මික විවිධාංගීකරණය සමග වැවිලි කර්මාන්තයට අමතරව වී, එළවළු, පළතුරු, ඖෂධීය පැලෑටි හා වෙනත් ආහාර බෝග වර්ග නිෂ්පාදනය ද දියුණු තත්ත්වයක පැවතුන බවට සාධක ඇත. ඒ අතරම ලෝකයේ වෙනත් රටවල් අතර කිට්ටු සම්බන්ධතාවන් ඇති වූ අතර, ප්‍රවාහන (ගුවන්/මුහුදු) පහසුකම් වැඩි දියුණු විය. මෙහි එක් ප්‍රතිඵලයක් ලෙස දේශීය ව නිපදවනු ලබන එළවළු හා පළතුරු වර්ග අපනයනය ආරම්භ විය. දැනට වසර 15 කට පමණ පෙර සිට මෙම අපනයන කටයුතු කෙරී ගෙන යන අතර, 1992 වර්ෂයේ පමණක් එළවළු හා පළතුරු අපනයනයෙන් ශ්‍රී ලංකාව රුපියල් මිලියන 535 ක විදේශ විනිමයක් උපයා ගෙන ඇත. මේ තුලින් විනිමය පරතරය අඩු කර ගැනීම, රැකියා ආයෝජනය, නිෂ්පාදකයාගේ ආර්ථික දියුණුව, නව තාක්ෂණික දැනුම ලබාදීම, ක්‍රමවත් ඉඩම් පරිහරණය යනාදී වාසි රැසක් අත්කර ගත හැකි විය.

## දේශීය නිෂ්පාදනය

වාර්ෂිකව එළවළු හා පළතුරු මෙ.ටො. 800,000 ක් දේශීය ව නිෂ්පාදනය කරනු ලබන බවට ඇස්තමේන්තු කර ඇත. මෙම නිෂ්පාදනයෙන් පරිභෝජනය කරනු ලබන්නේ 50% ක් පමණ වන අතර, ඉතා විශාල ප්‍රමාණයක් අපතේ යන බව දත්ත වලින් පෙනී යන කරුණකි. මෙම නාස්තිය වැළැක්විය හැකිය. ඒ සඳහා නිෂ්පාදකයාගේ සිට පාරිභෝගිකයා දක්වා වූ ක්‍රියාදාමය ප්‍රතිසංවිධානය කළ යුතුව ඇත.

1992 වර්ෂය තුල අපනයනය කර ඇති එළවළු හා පළතුරු ප්‍රමාණය මෙ.ටො. 20,000 පමණ වේ. මෙය මුළු නිෂ්පාදනයෙන් 2.5% පමණ වූ ඉතා සුළු ප්‍රමාණයකි.

## එළවළු හා පළතුරු අපනයනය

එළවළු හා පළතුරු අපනයනය කරන ආකාර කීපයකි. එනම්,

- අළුත් එළවළු හා පළතුරු
- සකස් කළ එළවළු හා පළතුරු සහ
- අධි ලෙස සකස් කළ එළවළු හා පළතුරු වශයෙනි.

අළුත්, සකස් කල, අධි ලෙස සකස් කළ එළවළු හා පළතුරු අපනයනය (මෙ.ටොන්)

| | | මාල දිවයින | මැද පෙරදිග | අනික් රටවල් | එකතුව | ප්‍රතිශතය % මාල දිවයින | මැද පෙරදිග | අනික් රටවල් |
|---|---|---|---|---|---|---|---|---|
| අළුත් පළතුරු | 1990 | 472 | 1102 | 847 | 2421 | 19 | 46 | 35 |
| | 1991 | 492 | 958 | 3400 | 4850 | 10 | 20 | 70 |
| | 1992 | 569 | 1319 | 2083 | 3971 | 14 | 33 | 53 |
| අළුත් එළවළු | 1990 | 464 | 2567 | 1238 | 4269 | 11 | 60 | 29 |
| | 1991 | 1095 | 2390 | 309 | 3794 | 29 | 63 | 8 |
| | 1992 | 3322 | 2569 | 332 | 6223 | 53 | 41 | 6 |
| සකස් කළ හා අධිව සකස් කළ එළවළු හා පළතුරු | 1990 | 43 | 65 | 7753 | 7861 | 1 | 1 | 98 |
| | 1991 | 50 | 195 | 9655 | 9990 | 1 | 2 | 97 |
| | 1992 | 45 | 86 | 9925 | 10056 | 0.4 | 1 | 98.6 |
| එකතුව | 1990 | 979 | 3734 | 9838 | 14551 | 7 | 26 | 67 |
| | 1991 | 1637 | 3543 | 13364 | 18544 | 9 | 19 | 72 |
| | 1992 | 3936 | 3974 | 12340 | 20250 | 19 | 20 | 61 |
| අවුරුදු 3 ක එකතුව | | 6552 | 11251 | 35542 | 53345 | 12 | 21 | 67 |
| ප්‍රතිශතය % | | 12 | 21 | 67 | 100 | - | - | - |

උපුටා ගැනීම : රේගු දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකාවේ අළුත් හා සකස් කළ එළවළු හා පළතුරු අපනයනයෙන් 12% මාල දිවයිනට ද, 21% මැද පෙරදිගට ද, 67% අනිකුත් රටවලට ද අපනයනය කරනු ලබයි. අනිකුත් රටවලට වන අපනයන 67% ට වැඩි වී ඇත්තේ කරුණු දෙකක් නිසාය. එනම් අළුත් පළතුරු යටතේ අනික් රටවලට අපනයන වන සියඹලා ප්‍රමාණය හා සකස් කළ/අධිව සකස් කළ එළවළු හා පළතුරු යටතේ අනික් රටවලට අපනයනය වන ගර්කින් ප්‍රමාණය යන කරුණු හේතුවෙනි. ගර්කින් හා සියඹලා සාධක වලින් ඉවත් කර බැලූ විට මාල දිවයිනට 27%, මැද පෙරදිගට 47%, අනිකුත් රටවලට 26% ශ්‍රී ලංකාවෙන් අපනයනය වී ඇත.

අළුත් එළවළු මෙ.ටො. 6000 ට වැඩි ප්‍රමාණයක් ද, අළුත් පළතුරු මෙ.ටො.4000 ක් පමණද වර්ෂයකට ශ්‍රී ලංකාවෙන් අපනයනය කෙරේ. මාල දිවයිනටත් මැද පෙරදිග රටවලටත් අළුත් එළවළු සඳහා වාර්ෂික ඉල්ලුම මෙ.ටො. 3000 ආසන්න වන අතර, මාල දිවයිනෙන් ඉල්ලුම වැඩිවෙමින් පවතී. මාල දිවයිනෙහි හා මැද පෙරදිග රටවල අළුත් පළතුරු සඳහා වාර්ෂික ඉල්ලුම මෙ.ටො. 500 හා 1250 ක් වන අතර මැද පෙරදිග රටවල ඉල්ලුමෙහි වර්ධනයක් ඇති බව දක්නට ඇත.

මාල දිවයිනෙහි වැඩි වශයෙන් ඉල්ලුමක් ඇත්තේ උඩරට එළවළු සඳහාය. පහතරට එළවළු වලට වැඩි ඉල්ලුමක් ඇත්තේ මැද පෙරදිග රටවලිනි. මාල දිවයිනට හා මැද පෙරදිග රටවලට කෙරෙන අළුත් පළතුරු අපනයනයෙන් වැඩි ප්‍රමාණයක් අන්නාසි, ගැට අඹ හා ගැට ගස්ලබු වේ. තවද, පකිස්ථානයට සියඹලා මෙ.ටො. 2000 ට වැඩි ප්‍රමාණයක් වාර්ෂිකව අපනයනය

කෙරේ. සකස් කළ හා අඩිව සකස් කළ එළවළු හා පළතුරු වලින් වැඩි ප්‍රමාණයක් (මෙ.ටො. 8000 ට වැඩි ප්‍රමාණයක්) ලුණු දියරයෙහි සැකසූ ගර්කින් වන අතර ඒවා ඕස්ට්‍රේලියාවට හා බටහිර රටවලට වාර්ෂිකව අපනයනය කරනු ලැබේ. අළුත් එළවළු අපනයනයෙන් ශ්‍රී ලංකාවේ අමු මිරිස් විශේෂ ස්ථානයක් ගනී. (වාර්ෂිකව මෙ.ටො. 500 ට ආසන්න ප්‍රමාණයක් විශේෂයෙන් මැද පෙරදිග රටවලට අපනයනය කෙරේ.)

## විශේෂ අවධානයට ලක්විය යුතු කරුණු

### වෙළඳ පොළෙහි තරඟකාරිත්වය

ශ්‍රී ලංකාවේ එළවළු හා පළතුරු අපනයනයේදී, ලෝක වෙළඳ පොළේ අනිකුත් රටවලින් අපනයනය වන එළවළු හා පළතුරු සමඟ තරග කිරීමට සිදුවේ. විශේෂයෙන්ම මාල දිවයිනට අපනයනය කරන විට ඉන්දියාව සමඟ ද මැද පෙරදිග රටවලට අපනයනය කරන විට ඉන්දියාව, තායිලන්තය, මැලේසියාව, චීනය, පිලිපීනය, ඊජිප්තුව, කෙන්යාව, ජෝර්දානය, සවුදි අරාබිය, හා ඕමානය වැනි රටවල් සමඟ ද තරග කිරීමට සිදුවේ. මෙහිදී අපනයන මිල, තත්ත්ව පාලනය, කලට වේලාවට අපනයන කිරීමේ හැකියාව හා ඉල්ලුම් ප්‍රමාණය අඛණ්ඩව යැවීමේ හැකියාව මත ශ්‍රී ලංකාවේ තරඟකාරී තත්ත්වය රඳා පවතී.

### ස්ථාවර මිල

අපනයන මිල කෙටිකාලීන ව ස්ථාවරය. එබැවින් අපනයනකරුවන් එළවළු හා පළතුරු ගන්නා මිලද ස්ථාවර විය යුතුය. එනමුදු දේශීය මිල කන්න අනුව වෙනස්වන ස්වභාවයක් පෙන්වයි. එබැවින් දේශීය මිලේ වෙනස්වීම අනුව අපනයන ප්‍රමාණයන් වෙනස් විය හැක. අපනයන ප්‍රමාණයන් අඩු වැඩි වීම ශ්‍රී ලංකාවේ අපනයන ස්ථාවර කිරීමට ඇති බාධාවකි.

### ශ්‍රී ලංකාවට විශේෂ වූ බෝග

ලෝක වෙළඳ පොළට පාරම්පරික වූ එළවළු හා පළතුරු වන බෝංචි, ගෝවා, තක්කාලි, වම්බටු, බීට්, බණ්ඩක්කා (බණ්ඩක්කා), රටඅනුනු, අන්නාසි, කෙසෙල් යනාදිය සඳහා ලෝක වෙළඳ පොළෙහි තරඟකාරීත්වය ඉතා වැඩිය.

විශාල පරිමාණයෙන් ලෝකයෙහි නොයෙකුත් රටවල නිෂ්පාදනය වන මෙම එළවළු හා පළතුරු සමඟ තරග කිරීමට ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණයෙන් වන නිෂ්පාදනයන්ට අපහසුය. හැකි සෑම අවස්ථාවකදීම ශ්‍රී ලංකාවට සීමා වූ, ලෝක වෙළඳ පොළෙහි විශේෂ වූ ඉල්ලුමක් ඇති සහ ශ්‍රී ලංකාව තුල ඉල්ලුමක් ඇති එළවළු හා පළතුරු වලට ප්‍රමුඛත්වයක් දිය යුතු වන්නේ මේ නිසාය. මෙවැනි සැසඳීමක් පහත දී ඇත.

| ලෝක වෙළඳපොළෙහි ඇති පාරම්පරික බෝග | ලෝක වෙළඳපොළෙහි ඉල්ලුමක් ඇති ශ්‍රී ලංකාවට සීමා වූ බෝග |
|---|---|
| 'කයේන්' අන්නාසි (ගල් අන්නාසි) | මුරිසි අන්නාසි |
| 'කැවෙන්ඩිෂ්' කෙසෙල් (ඇම්බුන්) | ඇඹුල් හා කෝලිකුට්ටු |
| 'ටොමී ඇට්කින්ස්' අඹ | විලාඩ් |
| තද දම්පාට අණ්ඩාකාර වම්බොටු | ලා දම්පාට ලේන ඉරි සහිත දිග වම්බොටු |
| රට අනුනු | රතු අනුනු (ලොකු) |
| දිගටි සැර අඩු අමු මිරිස් | මධ්‍යම දිගැති, තද කොළ පාට, සැර වැඩි අමු මිරිස් |
| ටාරෝ/කොල කේසියා වැනි අල වර්ග | කිරි අල හා ඉන්නල |

තවද ශ්‍රී ලංකාවට පමණක් බොහෝ දුරට සීමා වූ බෝග වන දිවුල්, වට්ටක්කා හා පුහුල් (මධ්‍යස්ථ ගෙඩි), නෙළුම් අල, කොහිල යනාදියට ද අපනයනයෙහිදී ප්‍රමුඛත්වයක් දිය යුතුය.

### කල් තබා ගත හැකි බෝග

ගුවන් මගින් අපනයනය කරන එළවළු හා පළතුරු වල මිල වැඩිය. තායිලන්තය, මැලේසියාව, කෙන්යාව වැනි රටවල පහසුවෙන් නරක් වෙන බෝග පවා නැව් ගත කිරීමේ තාක්ෂණය ඇති බැවින් වැඩි වාසියක් එම රටවලට ඇත. මෙම තාක්ෂණය ශ්‍රී ලංකාවේ දැනට සම්පූර්ණයෙන් නැති බැවින් වැඩිකලක් සුපුරුදු ශීත ගබඩාවල කන්ටේනර් වල තබා ගත හැකි එළවළු හා පළතුරු වන රතුඅනුනු, කිරි අල, ඉන්නල, වට්ටක්කා, නෙළුම් අල යනාදියට වැඩි ප්‍රමුඛත්වයක් දිය යුතුය. මෙවැනි බෝග දැන්ම අපනයනය කිරීමෙන් විදේශීය වෙළඳ පොල (විශේෂයෙන් යුරෝපීය රටවල්) තහවුරු කර ගත් විට තාක්ෂණය දියුණු වූ පසු අනික් බෝගවලට පවා විදේශීය ඇරයුම් ලබා ගැනීමට අපහසු නොවෙනු ඇත.

### ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත රටාවට ගැලපෙන බෝග

ඉහත සඳහන් ප්‍රමුඛත්වය දිය යුතු එළවළු හා පළතුරු වලට විදේශ වෙළඳපොලවල ඉල්ලුම, පාරම්පරික එළවළු හා පළතුරු වල ඉල්ලුමට වඩා අඩුය. ශ්‍රී ලංකාවේ එළවළු හා පළතුරු නිෂ්පාදනය කුඩා ගොවීන්ට සීමා වී ඇති බැවින්ද වාණිජ මට්ටමේ වගාවන් අඩු බැවින්ද ඉල්ලුම සීමා වූ බෝග අපනයනය ශ්‍රී ලංකාවේ දැනට ඇති නිෂ්පාදිත රටාවට ගැලපේ.

### ලෝක වෙළඳපොලේ සාධාරණ මිල

තරඟ කාරිත්වය සීමා වූ හා ඉල්ලුම වැඩිවෙමින් පවතින කුඩා වෙළඳ පොලක සාධාරණ මිලක් (නිෂ්පාදන වියදමට වඩා වැඩි මිලක්) ලබා ගැනීමට ඇති අවස්ථාව වැඩිය.

### බෝග කළමනාකරණයේ පහසුතා

මෙවැනි බෝගවලට භෞතික තත්ත්ව පාලනය හා අඛණ්ඩව සැපයීම ලෝක වෙළඳපොලෙහි පාරම්පරික බෝග හා සැසඳූ විට වඩාත් පහසු බැවින් ශ්‍රී ලංකාවේ කුඩා නිෂ්පාදකයන්ට පවා අපනයන ක්ෂේත්‍රයට ඇතුල්වීමේ හැකියාව වැඩිය.

### නොකඩවා අපනයනය

යුරෝපීය වෙළඳපොලට ඇතුල්වීමේ වඩාත් ප්‍රබල අලෙවි උපක්‍රම දෙක වනුයේ 'අපනයන ජනේලයක්' හෙවත් අපනයන

රික්තයක් ඇති කාලයේදී අපනයන කිරීම හා විශේෂ වූ ඉල්ලුමක් දරන අලෙවි කොට්ඨාශයකට අපනයන කිරීම වේ. අපනයන ජනේලයක් කරා අපනයන කළ හැක්කේ අවුරුද්දේ යම් කාලයකදී පමණි. තවද මෙම කාලයේදී අපනයනය කරනු ලබන්නේ පාරම්පරික බෝග භාවිතා කරන ප්‍රධාන වෙළඳපොලට නිසා, සැහෙන ප්‍රමාණයක් අපනයන කිරීමට සිදුවේ. විශේෂ වූ ඉල්ලුමක් දරන අලෙවි කොටස් වලට (උදා : එංගලන්තයේ ආසියාතිකයින් ජීවත් වන ප්‍රදේශ, මැද පෙරදිග ලාංකිකයින් යනාදි වශයෙන්) එළවළු හා පළතුරු අවුරුද්ද පුරා සැපයිය යුතුය. අවශ්‍ය ප්‍රමාණය සීමා සහිතය. අපනයන ජනේලයක් ඇති කාලවලදී පාරම්පරික බෝග වලට වැඩි මිලක් ලැබුනද, බොහෝ විට විශේෂ වූ ඉල්ලුමක් දරන බෝග වලට සැමදා සාධාරණ මිලක් ලැබෙනු ඇත. එබැවින් කුඩා නිෂ්පාදකයින්ට අපනයනයෙන් දිගුකාලීන ස්ථාවර ලාභ ලබා දිය හැක්කේ විශේෂ වූ බෝග වැවීමෙනි.

## නව අදහසක්

ඉහත කී කරුණු නිසා වඩාත් සුදුසු වනුයේ ශ්‍රී ලංකාවට විශේෂ වූ බෝග වගා කිරීමය. මෙවැනි උපක්‍රමයකින්, ශ්‍රී ලංකාවේ එළවළු හා පළතුරු අපනයන අත්තිවාරම වඩාත් ශක්තිමත් කරනු ඇත. ක්‍රමානුකූලව අපනයන තාක්ෂණය, අපනයන සේවා පහසුකම් හා වාණිජ මට්ටමේ වගාවන් (හෝ කුඩා නිෂ්පාදකයන් අතරේ සමූහ වගාවන්) දියුණු වනවාත් සමඟ ලෝක වෙළඳ පොලට පාරම්පරික බෝග වගා කිරීම ආරම්භ කළ හැක. ශ්‍රී ලංකාවේ එළවළු හා පළතුරු අපනයන කර්මාන්තය තවම ඇත්තේ ළාබාල අවදියකය. මෙම කර්මාන්තයට අවුරුදු 15 කට වඩා වයස නැත. විශේෂයෙන්ම කුඩා නිෂ්පාදකයන්ගේ සුපුරුදු නිෂ්පාදිත හා අලෙවි දැනුම වැඩි දියුණු කරමින් ක්‍රමානුකූලව සංවර්ධනය කිරීම රටේ සමතුලිත ආර්ථික සංවර්ධනයට රුකුලක් වන බව ස්ථිරය.

**ජේ. ඇන්. ඇස්. ඩයස්**
නියෝජ්‍ය අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

# ජන ගී

*ගොවිතැන සිය ජීවනෝපාය කොට ගත්, ගොවි සමාජයේ සංස්කෘතිකාංග මෙන්ම ඒ හා බැඳුන ජන දිවිය වෙසෙසින්ම සුන්දරය. ඔවුහු සිය ජීවන වෘත්තියේ නියැලී ලබන විඩාව දුරු කොට ගත්තේ වෘත්තීය මෙන්ම අදහන ආගම දහම හා සම්බන්ධ ජන කවියකින් හෝ නැටුමකිනි. නොමැති නම් කුඩා උත්සව පවා පවත් වන්නට ඔවුහු පසුබට නොවූහ.*

*ඔවුන් සිය ජීවන වෘත්තීය ට සම්බන්ධ වූයේ ද ලැබූ අස්වැන්න හා පුරා කියා ප්‍රයෝජනයට ගත්තේ ද ආගම දහම සිහි කිරීමෙන් අනතුරුව ය. මෙපණක් ම නොවේ. මේ සැමෙකක් හා බැඳුනු ඔවුන් ලැබූ අත්දැකීම් ද රසවත් කවියකට වස්තු විෂය විය. එවන් කවියකින් වර්තමානයේ වුවද ලද හැකි රසවින්දනය මෙපමණකැයි කිව නොහැක.*

*- සංස්කාරක -*

## දුක්මය බත් නැතිනම් තිසි සමයට ..........

බුදුන් ය තුන්ලොව උත්තම    වන්නේ
බුදුන් තමා තුන් සරණේ    කියන්නේ
ගඳින් මලින් බැති මල් පුද    දෙන්නේ
කෙතට අපේ සරණයි    තෙරුවන්නේ

ඉරේ රුවට ඉර වට කෙළින    ගිරවියේ
සඳේ රුවට සඳවට කෙළින    සාවියේ
මලේ රුවට මලවට කෙළින    බමරියේ
සිව්පද උපත අහපත් හුම    දේවියේ

අහස උපත් තැන සකි නුඹ    දන්නවද
පොලව උපත් තැන සකි නුඹ    දන්නවද
මුහුද උපත් තැන සකි නුඹ    දන්නවද
සිව්පද උපත් තැන සකි නුඹ    දන්නවද

අහස උපන්නේ අස්විද නැකතින්    නොවෙද
පොලව උපන්නේ පුව පුටුප නැකතින්    නොවෙද
මුහුද උපන්නේ මුවසිරි නැකතින්    නොවෙද
සිව්පද උපන්නේ විනාවෙන්    නොවෙද

බතනම් උත්තම දෙයකි    බොලන්නේ
නැතිනම් ලැබුමට එය රිසි    දෙන්නේ
කිසියම් ලෙස මැලි නොව    වෙහෙසෙන්නේ
එහෙනම් බත නොවැරදිව    ලැබෙන්නේ

වියට කැමති අය මෙලොව    සිටින්නේ
නයට බොහොම ගුණ ඇති දැන    ගන්නේ
ලොවට උතුම් දේ බතය    කියන්නේ
නරලොව නර සත එයින්    රැකෙන්නේ

සක්විති රජතම ලැබුනත්    නොනෙකුට
දුක්මය බත නැතිනම් තිසි    සමයට
වික් මැති පෙර රජවරු තළ    විලසට
එක්වම අපි බයිමුව අද    තුඹුරට

අහසට වැඳින් ඉරි දෙවි අවසර    ගනිමූ
පොලවට වැඳින් මිහිකත අවසර    ගනිමූ
සක්විති දෙවි වැඳ අවසර    ගනිමූ
ගොයමට වැඳින් සබයෙන් අවසර    ගනිමූ

වෙසක් පොසොන් මස බට නෝරා    ගන්ට
ඇසල නිකිණි මස මල් පීරා    ගන්ට
බිනර මහේ වැට තොටු සවි කර    ගන්ට
වප් මස පුරා වපුරන් අටු පුර    වන්ට

සම්පාදනය

**ලක්ෂ්මන් ජයකොඩි**